# ගුණදාස අමරසේකරගේ හා මහගම සේකරගේ කාව්‍ය නිර්මාණයන්හි ගැබ්වන ජනකවි ආභාසය

# The influence gained by Amarasekara and Sekara through folk poems

*සී. පවිත්‍රානි*

JOURNAL OF THE FACULTY OF HUMANITIES

## Abstract

Gunadasa Amarasekara and Mahagama Sekara were powerful poets during the decades of 1950 and 1960' It appears that, both these Sinhala poets have been engaged in poeticism with the influence of various poetic traditions'. Among them" folk songs hold a very special place in the poetic field'. Amalbiso˜ is a text where Amarasekara was strongly influenced by the folk song tradition while Sakvalihini˜ becomes Sekara's most effective influence in the folk poetry tradition. A variation of influence by these two composers gained from the folk song tradition could be clearly identified in the poem —Kinduru kumarige kathawa˜, in Sakvalihini and in the poetic creation —Amalbiso˜. Both these poems named Amalbiso˜ and —Kinduru kumarige kathawa˜ are based on a similar pattern of a story. Both these creations depict varied forms in poeticism. Although both Amarasekara and Sekara were influenced by folk poems, the poetic concepts that they built up were of completely different structures. Therefore, it is important to ascertain through a comparative investigation as to what form of influence has been gained by Amarasekara and Sekara through these folk poems.

***Keywords -*** Folk poems, Influence, Vision, Tradition

**සාරාංශය**

ගුණදාස අමරසේකර සහ මහගම සේකර 1950 සහ 1960 දශකවල සිංහල කාව්‍ය ක්ෂේත්‍රයේ කැපීපෙනෙන කවීහු වෙති. මෙම කවීන් දෙදෙනා ම විවිධ කාව්‍ය සම්ප්‍රදායන්ගේ ආභාසයෙන් කාව්‍යකරණයේ යෙදී ඇති අතර ජන කාව්‍ය සම්ප්‍රදාය ඒ අතර කැපී පෙනේ. ගුණදාස අමරසේකර රචනා කළ "අමල්බිසෝ" කාව්‍ය නිර්මාණය ඒ සඳහා නිදර්ශනයකි. එමෙන් ම සක්වාලිහිණි කාව්‍ය ග්‍රන්ථයේ පැනෙන "කිඳුරු කුමාරිගේ කතාව" යන මැයෙන් යුතු කාව්‍ය නිර්මාණය ජන කවි සම්ප්‍රදායෙන් සේකර ලැබූ ආභාසය ස්ඵුට කරන්නකි. එම කාව්‍ය නිර්මාණ සඳහා පාදක වී ඇත්තේ ද යම් තරමක සාම්‍යත්වයකින් යුතු වෘත්තාන්තයන් ය. ජන කාව්‍ය සම්ප්‍රදායෙන් මෙම නිර්මාණකරුවන් දෙදෙනා ම ලබා ඇති  බලපෑමේ ස්වභාවය තත් නිර්මාණද්වය සන්සන්දනාත්මක ව කියවීමෙන් ගම්‍යමාන කරගත හැකි වේ. මෙහිලා අපගේ අවධානය යොමු කෙරෙන විශේෂ කරුණක් වන්නේ අමරසේකර මෙන් ම සේකර ද ජන කාව්‍ය සම්ප්‍රදායෙන් බලපෑම ලබන්නේ විවිධත්වයක් සංකලක්ෂණය කෙරෙන අයුරින් වන බව යි.  එහි දී අමරසේකර වඩාත් නූතනවාදී ආකාරයෙන් සාම්ප්‍රදායික අමල්බිසෝ කතාවේ අර්ථය අද්‍යතන අනුභූතියකට සම්බන්ධ කරන අයුරු විමර්ශනය කළ හැකි ය. ඒ හා සාපේක්ෂ ව බලන කල සේකර ස්වකීය කාව්‍ය නිර්මාණයට ජනකවියේ ආභාසය ලබන්නේ අමරසේකර මෙන් රැඩිකල් ස්වරූපයකින් නොව සාම්ප්‍රදායික බෞද්ධ ජීවන පුරුෂාර්ථ මත මැනවින් රඳා සිටිමින් බව විද්‍යමාන වේ.


*ප්‍රමුඛ පද* - ජනකවි, ආභාසය, දෘෂ්ටිය, සම්ප්‍රදාය

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

## 1. හැඳින්වීම

ගුණදාස අමරසේකර හා මහගම සේකර 1960 දශකයේ ඉස්මතු වූ කවීන් දෙදෙනෙකි. කාව්‍යකරණය සම්බන්ධයෙන් ඔවුන් කළ නොයෙක් අත්හදාබැලීම් පසුකාලීන ව සිංහල කවිය කෙරෙහි තීරණාත්මක බලපෑමක් එල්ල කළේ ය. අමරසේකර හා සේකර යන දෙදෙනා ම නොයෙක් කාව්‍ය සම්ප්‍රදායවලින් ආභාසය ලැබූ බව පැහැදිලි කරුණකි. ඒ අතර ජන කවි සම්ප්‍රදාය බෙහෙවින් වැදගත් වේ. අමරසේකර ජන කවි සම්ප්‍රදායෙන් ලැබූ ආභාසය ඉතා ප්‍රබලව දිස්වන කෘතිය අමල් බිසෝ (1960) වන අතර සේකර කෙරෙහි ජන කවියේ බලපෑම වැඩි වශයෙන් පෙන්නුම් කරන්නේ සක්වාලිහිණි (1962) කාව්‍ය ග්‍රන්ථයයි. අමල් බිසෝ කෘතියෙහි පැනෙන එනමින් යුතු කාව්‍ය නිර්මාණය හා සක්වාලිහිණි ග්‍රන්ථයෙහි හමුවන කිඳුරු කුමාරිගේ කතාව කවිපෙළ ඇසුරින් මෙහිලා කවීන් දෙදෙනා ජන කවියෙන් ලබන ආභාසයේ විවිධත්වය විමර්ශනය කෙරේ.

## 2. සාහිත්‍ය විමර්ශන

ගුණදාස අමරසේකර හා මහගම සේකර ජනකවි සම්ප්‍රදායෙන් ආභාසය ලබා ඇත්තේ කවර ආකාරයෙන් ද? යන්න මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුව යි. ඒ පිළිබඳ ව විමර්ශනයෙහිලා කේන්ද්‍රීය අවධානය අමරසේකරගේ අමල්බිසෝ කාව්‍යය ග්‍රන්ථයෙහි පැනෙන අමල්බිසෝ යන මැයෙන් යුතු නිර්මාණය හා මහගම සේකරගේ සක්වාලිහිණි කෘතියෙහි පැනෙන  කිඳුරු කුමාරිගේ කතාව කෙරෙහි යොමු කෙරේ. ඒ අනුව පර්යේෂණ සීමාව එම කාව්‍ය නිර්මාණ ද්වයෙන් සංලක්ෂණය කළ හැකි ය.

අමල් බිසෝ කාව්‍යයෙහි පෙරවදනෙහිලා අමරසේකර මෙසේ පවසයි.

"නූතන සිංහල කවිය ජන කවියෙන් ආභාසය ලැබීමට තැත් කළ ප්‍රථම ප්‍රයත්නය අමල් බිසෝ කාව්‍යයයි මම සිතමි. අමල් බිසෝ පළමු වරට ප්‍රකාශයට පත් කරන ලද්දේ පනස් ගණන්වල අග භාගයේදීයි. අමල් බිසෝ පළවීමෙන් පසු ජන කවිය ගුරු කොට ගත් නිර්මාණ කීපයක් හැට ගණන්වල මුල් භාගයේ දී පළවිය. මහගම සේකරගේ සක්වා ලිහිණි අමල් බිසෝ වැනි ම කවිකතාවකි."[11]

අමරසේකරට පෙරාතුව ද කොළඹ පරපුරේ කවීන් ජන කවියෙන් යම් ආලෝකයක් ලැබූ අවස්ථා හමුවන අයුරු අවධානයට ගත හැකි ය. පී. එච්. පෙරේරා රචනා කළ කුරක්කන් හේන, කේයස් ලියූ ධීවරී ගීතය එබඳු කාව්‍ය නිර්මාණ වේ. එහෙත් අමල් බිසෝ කාව්‍යය තරම් පැහැදිලි ව හා ප්‍රබල ව  ජන කවි ආභාසය සංලක්ෂණය කරන නූතන කාව්‍ය නිර්මාණයක් ඊට පෙර පැහැදිලි ව හඳුනාගත නොහේ. මහගම සේකරගේ සක්වා ලිහිණි අමල් බිසෝ වැනි ම කවි කතාවකියි අමරසේකර පවසතත් අමල් බිසෝ කවි කතාවට වඩාත් සමීප වන්නේ සක්වා ලිහිණි කෘතියෙහි පැනෙන එනමින් යුතු නිර්මාණය නොව කිඳුරු කුමාරිගේ කතාව කවිපෙළ බව පැහැදිලි කරුණකි. අමල් බිසෝ හා කිඳුරු කුමාරිගෙ කතාව යන නිර්මාණ ද්වයට ම පාදක වන්නේ එක හා සමාන කතා වස්තුවකි.

[11] අමරසේකර, ගුණදාස, (1993). අමල් බිසෝ. (තෙවන මුද්‍රණය). කොට්ටාව, සාර ප්‍රකාශන. 09.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

එහෙත් ඒ ඒ කවියාගේ රීතියට අනුව කාව්‍ය නිර්මාණ ද්වයෙහි භාෂාව, කාව්‍යෝක්ති, ආකෘතිය හා ජීවන දෘෂ්ටියෙහි විවිධත්වයක් ප්‍රදර්ශනය කෙරෙන අයුරු මෙහිලා අවධානයට ගත හැකි ය.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙහිලා මුඛ්‍ය අවධානය අමරසේකරගේ අමල් බිසෝ (1960) හා මහගම සේකරගේ සක්වාලිහිණි (1962) යන කෘතීන්හි අන්තර්ගත පද්‍ය නිර්මාණ ද්වයක් කෙරෙහි යොමු කෙරෙන හෙයින් ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ යථෝක්ත කාව්‍ය ග්‍රන්ථ ද්විත්වයයි. ඒ හැරුණු විට අදාළ පරිදි යථෝක්ත කවීන් දෙදෙනාගේ වෙනත් කාව්‍ය කෘතීන් ද උපස්තම්භක කරගැනේ. ද්විතීයික මූලාශ්‍රය වශයෙන් අමරසේකරගේ හා සේකරගේ කාව්‍ය නිර්මාණ ආශ්‍රයෙන් ලියවුණු විචාර ග්‍රන්ථ, සඟරා හා පුවත්පත් ලිපි මෙන් ම අන්තර්ජාල පරිශීලන දැක්විය හැකි ය. ඒ අනුව ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පාදක කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරුණු බව කිව හැකි ය.

## 4. සාකච්ඡාව හා ප්‍රතිඵල

අමල් බිසෝ කාව්‍යය නිර්මාණය සඳහා වස්තු විෂය වී ඇත්තේ ජනශ්‍රැතියෙහි හමුවන ප්‍රකට ජනකතාවකි. තත් ජනකතාව සමතික්‍රමණය කරමින් අමරසේකර ඒ පුවතට නවමු අර්ථකථනයක් ලබා දීමට උත්සාහ කරයි. පේරාදෙණි ගුරුකුලයට අයත් නිසඳැස් කවීන් එලියට්, පවුන්ඩ් යනාදි කවීන් අනුව යාම හේතුවෙන් ගොඩනැඟුවේ ඉංග්‍රීසි භාවිතය මත පදනම් වූ කෘත්‍රිම රූපක බවත්, ඒ අතර අමරසේකර සිංහල ජනකවිය කෙරෙහි නැඹුරු වෙමින් කාව්‍ය සම්ප්‍රදායක් ගොඩනැඟීමට වෑයම් කළ බවත් විමල් දිසානායකගේ ද අවධානයට ලක් ව තිබේ.[12] අමරසේකර අමල්බිසෝ කතා පුවත උපයෝගී කරගනු ලබන්නේ පාරිශුද්ධත්වය අහිමි ව වැලපෙන විමලා නමැති තරුණියගේ වරද සාමාන්‍ය මිනිස් ස්වභාවයක් බව කියාපෑමට ය. මෙහි දී ඔහු මතුකරන ප්‍රස්තුතය ලාංකේය සමාජ සංස්කෘතික පදනම සමඟ ඓන්ද්‍රිය ලෙස ප්‍රතිබද්ධ ව පවතී. සිංහල ග්‍රාමීය සමාජ පසුබිම අතුරෙහි නිරන්තරයෙන් ථෙරවාදී බෞද්ධ ඉගැන්වීම් සිහිකැඳවෙන නමුත් යුවතියකගේ පාරිශුද්ධත්වය අහිමි වීම සමාව භජනය කළ නොහැකි තරමට දරුණු වූවක් ලෙස සලකන බව පෙනේ. කවියා එම ප්‍රස්තුතය ලෞකික දිවිපෙවෙතේ සෞන්දර්ය හා ප්‍රකෘති ආවේගයන්හි මැඩලිය නොහැකි බව කුළුගැන්වෙන අයුරින් නිරූපණය කරයි. "අමරසේකර තම චින්තනය තුළ වෛෂයික ලෝකය කෙරෙහි ආශාව ප්‍රහීන කරමින් ඉන් එතෙර වීමට තැනත් දෙතොත් ඒ මඳ වශයෙනි. ඒ වෙනුවට ග්‍රාමීය සිංහල බෞද්ධ සුළුධනේශ්වරයෙහි සාමාජිකයකු හැටියට තමන්ට ඇති ආර්ථික, සාමාජික හා සංස්කෘතික ප්‍රශ්න තම චින්තනය හරි මැදට ගෙන එයි."[13] අමරසේකර ප්‍රබල සමාජ සංස්කෘතික ප්‍රස්තුතයක් පිළිබඳ සාකච්ඡා කරන නමුත් ස්වකීය කාව්‍ය නිර්මාණයෙහි පදනම කාල්පනික පසුතලයක් මත පිහිටුවීමට වෑයම් කරන බව පසක් වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

[12] Dissanayake, Wimal, (2005). Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals. Boralesgamuwa, Visidunu Publications. 113.

[13] විජේගුනසිංහ, පියසීලි, (2005). නූතන සිංහල සාහිත්‍ය විචාරය - මාක්ස්වාදී අධ්‍යයනයක්. (දෙවන මුද්‍රණය) කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 172.

තව දුරටත් දිසානායක පවසන්නේ අමල්බිසෝ කාව්‍ය ග්‍රන්ථයෙහි එක් එක් කවියෙන් අමරසේකර, ජනකවි ආකෘතිය භාවිත කරමින් තත්කාලීන දැනවීම් හා හැඟීම් පිළිබඳ ව්‍යුහයක් සම්ප්‍රේෂණය කළ බවයි.[14] විශේෂයෙන් ම තත් කාව්‍ය නිර්මාණයේ පැනෙන හිමව් පියස, රකුස් පුරය, හසඟනන්, සුවඳ සඳුන්, රන් විමන යනාදි සංකල්ප ඇසුරින් කවි සමයානුගත මුහුණුවර තිව්‍ර කොට තථ්‍ය ලොව කෙරෙන් දුරස්ථ කෙරෙයි. එහෙත් මෙහිලා ප්‍රතිනිර්මාණය වන්නේ තත්කාලීන නූතන සමාජ අනුභූතියකි. අමරසේකර මෙය නිරායාසයෙන් සිදු කරන්නක් නොවන බව ලියනගේ අමරකීර්ති "නවකතාවාදීත්වය සහ සිංහල කවියේ අර්බුදය" යන මැයෙන් යුතු පුවත්පත් ලිපියෙහි දක්වන අදහස් ඇසුරින් හඳුනාගත හැකිය.

"සිංහල කාව්‍යයෙහි එක් දුර්වලතාවයක් ලෙස ඔහු දකින කාව්‍ය අනවශ්‍ය ලෙස තථ්‍ය, ඓතිහාසික යථාර්ථය සමග සමගාමී ඒ හා බද්ධ වූ නිර්මාණ වීම ලෙස අමරසේකර මහතා මතු කරන තර්කයේ ඇත්තක් තියෙනවා. අමරසේකර මහතා මේ සඳහා යෝජනා කාව්‍ය කාල්පනික නිර්මාණ කළ යුතු බවයි. කාල්පනික නිර්මාණ සඳහා අප යොදාගන්නේ සංස්කෘතික සාහිත්‍යික ස්මෘතිය හා බැඳී වෙළී පවත්නා පැරණි වෘත්තාන්ත, ජාතක කතා හා ජන කතා ආදියයි යනුවෙන් ඒ මහතා ඊළඟට කියනවා"[15]

අමරසේකර අමල් බිසෝ කාව්‍ය නිර්මාණය මඟින් මෙම ලක්ෂණය ප්‍රබල ව විශද කරන අතර ඒ හා සාපේක්ෂව බැලූ කල සේකර ලියූ කිඳුරු කුමාරිගේ කතාව වෙනස් මුහුණුවරක් සංලක්ෂණය කරයි. කිඳුරු කුමාරිගේ කතාවෙහි වස්තු විෂය ජනශ්‍රැතිය යම් පමණකින් මූලාශ්‍රය කරගනිමින් නිර්මාණය කරන ලද්දකි. කිඳුරු විමන, කිඳුරු කුමරිය හා යකිනිය යනාදි වශයෙන් කාල්පනික මුහුණුවර ගොඩනඟන සංකල්ප එහිලා හමුවුව ද සේකර කාල්පනිකත්වය තථ්‍ය ලෝකය සමඟ සම්බන්ධ කරයි. කිඳුරු කුමරිය සමඟ ප්‍රේමයෙන් බැඳෙන්නේ මිනිස් කුමරුවෙකි. එහෙත් අමල්බිසෝ ග්‍රහණය කරගන්නේ රකුසෙකි. අමරසේකර සමස්ත අමල් බිසෝ කතාව ම කාල්පනිකත්වයෙන් අනූන ව නිර්මාණය කරන අතර අවසානයේ දී එය විමලාගේ වරද නිරවද්‍ය බව සනාථ කිරීමට යොදාගනී. අමල් බිසෝ මෙන් ම කිඳුරු කුමරිය ද යොවුන් වියට පත්වත් ම ගින්නෙන් දැවෙයි. කවීන් දෙදෙනා ම ගින්නෙන් සංකේතාර්ථයෙන් රාග අග්නිය අර්ථවත් කරන බව පෙනේ. අමරසේකරගේ කාව්‍ය නිර්මාණය මුළුල්ලේ ම ගින්නේ ප්‍රබලත්වය තියුණු ලෙස අවධාරණය කෙරේ. ගිනි නැඟෙන කේන්ද්‍රස්ථානය වන්නේ රකුස් පුරයයි. ගිනි නැඟෙන්නේ රකුසන්ගේ ගතිනි. සියුමැලි අමල් බිසෝ එම ගින්නෙහි ගොදුරක් වේ.

"අහස පළා ගෙන නඟිනා
දෙරණ පළා ගෙන නඟිනා
දසත දිගත විහිදු වනා
එගිනි කඳින් පුර දිලෙනා"[16]

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

---

[14] Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals,113.
[15] සිළුමිණ. පුන්කලස. (2006-04-02) iii.
[16] අමල් බිසෝ, 49.

හිමව් පියස සුවඳ සඳුන් රන් විමනක තබා නොයෙක් උපදෙස් ලබා දුන් නමුත් අමල් බිසෝ ප්‍රකෘති ආවේගයන්ගෙන් මිදීමට නොහැකි තත්ත්වයට පත්වෙයි. කවියා එගින්නේ ආකර්ෂණය හා තියුණු ක්‍රියාකාරීත්වය යළි යළි ඉස්මතු කරන්නේ ජනකවියෙහි පැනෙන අලංකරණ විධියක් වූ පුනරුක්තිය ද උපස්තම්භක කර ගනිමිනි. ඒ හා සාපේක්ෂ ව බැලූ කල සේකර රාගාග්නියේ දීප්තිය හා දැවීම නිර්මාණය කරන්නේ එතරම් තියුණු අයුරින් නොවේ. අමරසේකර ලෞකික ආරම්මණයන්හි බලපරාක්‍රමය අවධාරණය කරන විට සේකර ලෝකෝත්තර පසුබිමක රඳා හිඳිමින් දිවිය වෙළා ගත් අනිත්‍යතාව පිළිබඳ ගම්‍ය කරන සෙයකි.

"ලොවේ හැම සතට උරුමයි මේ ගින්න
නොවේ කිසිවකුත් ඒ ගැන නොම දන්න
බවේ සරන සත ඒ ගිනි මැද ඉන්න
දැවේ නිතින් නොහැකි ව ඉන් වළකින්න"[17]

ගින්නෙන් මුදනු වස් අමල් බිසෝ රඳවා ඇත්තේ හිමව් පියස රන් විමනක ය. කිඳුරු කුමරිය සිටින්නේ සයුර යට රිදී කුළක් මුදුනේ ඇති රන් විමනක ය. ඔවුහු ක්‍රමයෙන් යොවුන් වියට පත්ව රූපශෝභාවෙන් ආඪ්‍ය වෙති.

"ගෝමර මල්පෙති බඳ වට ඉසුණා
රූබර සිහිනිඟ සිහිනි ව සැදුණා
ඈ පුළුලුකුල ද වට කොට සැදුණා
නාඹර තුනුවිල මල්පෙති වැටුණා"[18]

"දැල ළමැද අළු ගෝමර ඉසින ළඳා
බාල ළපටි අත් මාලා සලන ළඳා
ආල වඩන රූපෙන් මන බඳින ළඳා
කෝල සිතින් ඇස ලා වට බලන ළඳා"[19]

අමරසේකර මන දල්වෙන ගින්න හා සමගාමීව ඇය ගත ඇති වන විපර්යාසයන් ද චමත්කාරජනක ව ප්‍රතිනිර්මාණය කිරීමෙහිලා සමත් ය. එමෙන් ම ජනකවි සම්ප්‍රදායේ ආභාසය ද මනාව ධ්වනිත කෙරෙන පරිද්දෙන් කාව්‍යෝක්ති ගොඩනගා තිබේ. ගෝමර, නාඹර, අළු ගෝමර, අත් මාලා යනාදි යෙදුම් ඒ සඳහා මනා උදාහරණ වේ. අමල් බිසෝහි කේන්ද්‍රීය ධාරණාව වන්නේ ගින්නෙන් දැවීම මිනිසත් බවට හිමි වරදක් වන බවයි. කවියා අමල් බිසෝ කුමරියගේ රූපශ්‍රීය වර්ණනා කරන්නේ ද එම අර්ථය කුළුගැන්වෙන අයුරිනි. ඇගේ ගතේ ප්‍රබෝධය වනාහි යොවුන් වියේ උතුරායනසුලු ජීව ශක්තිය ද අඟවන්නකි. මෙහිලා අමරසේකර කාව්‍යෝක්ති ප්‍රතිනිර්මාණය කෙරෙන් ජනකවියේ ආභාසය ලබන නමුත් මිනිස් ප්‍රකෘති ආවේග නිර්මාණයෙහිලා ජීවන දෘෂ්ටිය කෙරෙන් වඩාත් නූතනවාදී මුහුණුවරක් විශද කරන ආකාරය කැපීපෙනේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28

[17] සේකර, මහගම, (2005). සක්වාලිහිණි. (තෙවන මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 37 පිට.
[18] අමල් බිසෝ, 50.
[19] සක්වාලිහිණි, 38.

සම්ප්‍රදාය මත පිහිටා සිටිමන් ම ඔහු ස්ථාපිත කිරීමට වෑයම් කරන්නේ යුවතියකගේ පාරිශුද්ධත්වය අහිමි වීම නොතකා හැරීම පිළිබඳ නූතන මතවාදයකි. "නූතනවාදය තුළ අද්‍යතන ජීවිතය, තත්කාලීන සමාජ හා සමකාලීන විඥානය කාව්‍යාත්මක ලෙස නිරූපණය කිරීමට ගත් උත්සාහය අතින් ඔහු ටී. ඇස්. එලියට්, ඩබ්ලියු. බී. යේට්ස් ආදී ඉංග්‍රීසි නූතනවාදී කවියන් හා සමතැන් ගනියි.[20] මේ හා සාපේක්ෂ ව බැලූ කල සේකර එබඳු කේන්ද්‍රීය අර්ථයක් ප්‍රබල ලෙස ගොඩනැඟීමට වෑයම් නොකරයි. ඔහු කිඳුරු කුමාරියගේ රූපශ්‍රීය වර්ණනා කරන්නේ ඇගේ යොවුන් රූපශ්‍රීය මතුනොව බොළඳ ළමා ස්වරූපය ද ඇඟවෙන පරිද්දෙනි. මෙහිලා සේකරගේ කාව්‍ය සංකල්පනා තරමක් දුබල වීමට ඔහු භාවිත කරන කාව්‍ය ආකෘතිය ද බලපා ඇත. අමල් බිසෝ කාව්‍ය නිර්මාණයෙහිලා අමරසේකර අවස්ථෝචිත ව විරිත් වෙනස් කරයි. අමල් බිසෝගේ චෛතසික ස්වභාව, රකුසන්ගේ ක්‍රියාකාරීත්වය, ගින්නේ දැවෙනසුලු බව ආදිය තිව්‍ර ලෙස සූචනය කිරීමට උචිත ලෙස දිගු විරිත් හා කෙටි විරිත් පරිභාවිතය ඇසුරින් වඩාත් විචිත්‍ර ව කාව්‍යෝක්ති නිර්මාණය කර තිබෙනු දකිය හැකි ය. එහෙත් සේකර කිඳුරු කුමාරිගේ කතාවෙහිලා යොදාගන්නේ මාත්‍රා දහඅටකින් සමන්විත එක ම විරිතකි. ඒ අතර ම බොහෝ විට කව්වල මුල හා අග ආයාසයෙන් එළිසමය පිහිටුවීමට දරූ උත්සාහය ද අර්ථය ලිහිල් කිරීමට බලපෑ අවස්ථා බහුල ව දක්නට ලැබේ. "ආකෘතිය වූ කලී වස්තු විෂයෙහි තර්කානුකූල ප්‍රතිඵලයක් බව වටහා ගැනීම සේකර කවියකු වශයෙන් සාර්ථක වීමට තුඩුදුන් වැදගත් කරුණකි."[21] එහෙත් මෙම කවි පෙළෙහිලා සේකර, වස්තු විෂය ඔප්නැංවීමට ආකෘතිය ඖචිත්‍ය පූර්වක ව භාවිත කිරීමට අසමත් ය. අමරසේකර එම අභියෝගය සාර්ථකව ජයගනී.

අමල් බිසෝ ගින්නෙන් දැවෙන්නේ හුදු ප්‍රේමාන්විත බන්ධනයක ප්‍රතිඵලයක් ලෙස නොවේ. ඈ ගින්නෙන් වෙළී රකුසු හඬට දොර අරින්නී ය. දූෂිතවූ පව්වු ලොව අතුරෙහි යුවතියකගේ පිවිතුරු බව රැකගැනීම ඉතා අසීරු කර්තව්‍යයක් බව අමරසේකරගේ නිර්මාණවල නිතින් හමුවන අදහසකි. අමල් බිසෝ කාව්‍යයෙහි ම හමුවන කත්‍යාව කාව්‍ය නිර්මාණයෙහි ද මෙසේ පැවසේ.

"වසා ගත් පෙති තුළ මුවා කොට
ඒ අමා මකරන්ද බින්දුව
පළා බොන්නට මුව අයාගත්
නැද්ද රකුසෙක් තව ම මේ විල"[22]

සියුමැලි යුවතිය රකුසු ග්‍රහණයට හසුවීම හුදු රැවටීමක, අත්වැරදීමක හෝ ක්ෂණික ආවේගයක ප්‍රතිඵලයක් වන බව අමරසේකර පෙන්වා දෙයි. එහෙත් කිඳුරු කුමාරිය ගින්නෙන් දැවෙමින් මැදුරෙන් පිටවී ප්‍රේමාන්විත ග්‍රහණයකට හසුවන්නී ය. කිඳුරු කුමරිය මිනිස් කුමරකු සමඟ සැළමුතු පෙමින් බැඳේ. කුමරු කෙරෙන් රකුසු මුහුණුවරක් දිස් නොවන අතර ඔවුන් හමුවේ පවත්නා බාධකය වන්නේ කින්නර යෝනියේ කුමරියකට මිනිස් කුමරකු සමඟ එක් ව විසීම නොකළ හැකිවීම යි. ඔවුන්ගේ ගින්න නිවෙන්නේ මරණයෙන් පසු ව පමණි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 28

[20] ඉලයප්ආරච්චි, එරික්, (2005). විචාර පත්‍රිකා. (පළමු මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ. 26.

[21] කුමාරසිංහ, කුලතිලක, (2002). නූතන කාව්‍ය විමර්ශන ලේඛන - ද්විතීය භාගය. (පළමු මුද්‍රණය). කොළඹ 10 ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. 140.

[22] අමල් බිසෝ, 38.

අවසානයේ ඔවුහු මරු සුවය පතති. බාධා විපත් දුරු කරනුව මරණය හැර අන්මගක් නැති බව කවියා අවධාරණය කරයි. මෙය සුබවාදී ජීවන දෘෂ්ටියක් නොවේ. එය වනාහි ජනකවි අතුරෙහි ද හමුවන "මොකද කරන්නේ පූරුවෙ කළ පවට" වැනි නිගමනයකි. එහෙත් අමරසේකර ඊට වෙනස් දෘෂ්ටියකින් මිනිසත් බවට හිමි වැරදි නොතකා හැරීම පිළිබඳ අදහසක් ඉස්මතු කරයි. එහි දී මිනිස් සත්ත්වයාට ප්‍රාකෘතික ලිංගික ආවේගවලින් මිදිය නොහැකි බව අවධාරණය කළ ලෝරන්ස්ගේ දෘෂ්ටිය ද මෙහි දී අමරසේකර කෙරෙහි බලපා ඇති බව පෙනෙයි. අමල් බිසෝ කවිපෙළ සම්බන්ධයෙන් වැදගත් නිරීක්ෂණයක් ඒ. එම්. ජී. සිරිමාන්න, 'ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා' නමැති ලිපියෙහි දක්වයි.

"අප මෙහි දී ඇසිය යුතු වැදගත් ප්‍රශ්නයකි. ඒ විමලාට වූ සිද්ධිය හා අමල් බිසෝ ගින්නෙන් දැවීමයන කතුවරයාගේ අදහස කුමක්ද යනු යි. එය මිනිසත් බවට හිමි වරදක් වෙතැයි කතාකාරයා මුලදීම කියයි. එය වරදකැ යි කියන්නේ ඇයි? එය වරදක් බව පෙනෙන්නේ ථෙරවාද ඉගැන්වීම් හා වික්ටෝරියානු සමාජ සභ්‍යත්වය පිළිගත්තවුන්ටය."[23]

මේ පිළිබඳ ව තවදුරටත් විමසා බැලීමේ දී පෙනෙන්නේ කවි පෙළ ඇරඹුමේ දී විමලාගේ වරදෙහි නිරවද්‍යතාව ලොවට ඇසෙන සේ කියා පෑමට අදහස් කරන බව කීවත් අමරසේකර අමල් බිසෝ දොර හැරීම හා ගින්නෙන් දැවීම මහා විනාශයක් ලෙස නිරූපණය කර ඇති බව යි. එමගින් සංකේතාත්මක ව ඇඟවෙන්නේ ඇගේ පාරිශුද්ධිය අහිමි වීම බරපතළ වරදක් බවමැයි.

"නිදන් වසා සිටිය      දොරා
තිදස් පුරේ රුවන්      දොරා
ලෙවන් නුදුටු රුවන්      දොරා
ඈ ඇරියේ එවන්      දොරා

පිට පිට හෙණ හඬ      විහිදිණ
මිහිකත සත් යළක්      සැළිණ
සිරුර බිඳී ලේ      වැගිරිණ
එගිනි මැදෙහි ඈ      බිලිවිණ"[24]

මෙම තත්ත්වය පැහැදිලි ව වටහා ගැනීම සඳහා නැවතත් ලාංකේය නූතනත්වයේ යථා ස්වභාව පිළිබඳ ව අවධානය යොමු කළ යුතු වෙයි. මෙරට නූතනත්වය සමාජ පරිස්ථිතියේ සිදු වූ විපර්යාස හේතුවෙන් ඓන්ද්‍රීය වශයෙන් උත්පාද නොවූවක් බවත් එය යටත් විජිතවාදයේ අතුරු ඵලයක් බවත් පැහැදිලි කරුණකි. අමරසේකර පැවසීමට උත්සාහ කළ ප්‍රස්තුතයට පටහැනි අයුරින් තරුණියගේ පාරිශුද්ධිය අහිමි වීම ලොව ම කම්පා කරවන්නක් ලෙස නිරූපණය වී ඇත්තේ ද තවමත් මෙරට නොනැසී පවත්නා සාම්ප්‍රදායික සමාජ ප්‍රතිමානයන්හි බලපෑම යටතේ ය. නූතනවාදී ලේඛකයෝ වික්ටෝරියානු සුචරිතවාදය හෙළා දුටුවහ.

---

[23] සිරිමාන්න, ඒ.එම්.ජී. (2002).ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා. වීමංසා නවකතා අංකය. කොළඹ 10 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 113.
[24] අමල් බිසෝ, 64.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-28

එහි නියමුවා වශයෙන් හඳුනාගත හැකි ඩී.එච්. ලෝරන්ස්ගේ කෘතීන්ගේ ආභාසය ලබා ලිංගික ආවේග නොබිය ව පිළිගත යුතු බව අමරසේකර ද බොහෝ නිර්මාණයන්හි නිරූපණය කර ඇති නමුත් ලාංකේය සමාජ පුරුෂාර්ථ මුළුමනින් ම ප්‍රතික්ෂේප කිරීමට අපොහොසත් වූ අයුරු ද මේ අනුව හඳුනා ගත හැකි ය.

## 5. සමාලෝචනය

අමරසේකරගේ අමල්බිසෝ කාව්‍ය ග්‍රන්ථයෙහි පැනෙන අමල්බිසෝ යන මැයෙන් යුතු නිර්මාණය හා මහගම සේකරගේ සක්වාලිහිණි කෘතියෙහි පැනෙන කිඳුරු කුමාරිගේ කතාව කවි පෙළ පාදක කරමින් තත් කවීන් දෙදෙනා ජනකවියේ ආභාසය ලබන්නේ කවර ආකාරයෙන් ද යන්න මෙහිලා සාකච්ඡාවට බඳුන් කෙරිණි. එහි දී අමරසේකර වඩාත් නූතනවාදී ප්‍රවේශයකින් සාම්ප්‍රදායික අමල්බිසෝ කතාවේ අර්ථය නූතන අනුභූතියකට සම්බන්ධ කරන අයුරු සුවිශද විය. සේකර ස්වකීය කාව්‍ය නිර්මාණයට ජනකවියේ ආලෝකය ලබන්නේ අමරසේකර මෙන් රැඩිකල් ස්වරූපයකින් නොව සාම්ප්‍රදායික බෞද්ධ ජීවන පුරුෂාර්ථ මත මැනවින් රඳා සිටිමින් බව ගම්‍යමාන වේ. එමෙන් ම සමාජ, සංස්කෘතික පරිස්ථිතිය මත පදනම් ව අමරසේකරගේ එකී රැඩිකල් ස්වභාව වුව යම් සීමාවක සිරගත වන අයුරු ප්‍රදර්ශනය වේ. ඒ ආශ්‍රයෙන් තත් කවීන් දෙදෙනාගේ කාව්‍ය භාවිතයෙහි එක් පැතිකඩක් හඳුනාගත හැකි ය.

## 6. නිගමනය

සමස්තයක් වශයෙන් ගත් කල අමල් බිසෝ හා කිඳුරු කුමාරිගේ කතාව යන කාව්‍ය නිර්මාණ ද්වය ඇසුරින් සුප්‍රකට කවීන් දෙදෙනකුගේ කාව්‍ය භාවිතාව කෙරෙහි ජනකවිය බලපෑ අයුරු හඳුනාගත හැකි ය. එක ම ජනකවි සම්ප්‍රදායේ ආභාසය කවීන් දෙදෙනා කෙරෙහි බලපා ඇත්තේ විවිධත්වයක් සංලක්ෂණය කෙරෙන අයුරිනි. විශේෂයෙන් ඒ පසුබිමෙහි පවත්නේ අමරසේකරගේ හා සේකරගේ පෝෂණ අවකාශයේ විවිධත්වය, ජීවන දර්ශනයේ විෂමතාව හා කාව්‍ය ශිල්ප ධර්ම භාවිතයෙහි පළ කළ කුසලතාව යනාදියයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

අමරසේකර, ගුණදාස, (1993). අමල් බිසෝ. (තෙවන මුද්‍රණය). කොට්ටාව, සාර ප්‍රකාශන.
අමරසේකර, ගුණදාස, (2009). උයනක හිඳ ලියූ කවි. (තෙවන මුද්‍රණය). බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශන.
සේකර, මහගම, (2005). සක්වාලිහිණි. (තෙවන මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

## ද්විතීයික මූලාශ්‍රය

ඉලයප්ආරච්චි, එරික්, (2005). විචාර පත්‍රිකා. (පළමු මුද්‍රණය). කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
කුමාරසිංහ, කුලතිලක, (2002). නූතන කාව්‍ය විමර්ශන ලේඛන, ද්විතීය භාගය. (පළමු මුද්‍රණය). කොළඹ 10 ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
දනන්සූරිය, ජිනදාස, (2005). කලාත්මක පරිකල්පනය, කාව්‍ය විචාර චින්තා, (පළමු මුද්‍රණය). කොළඹ 10. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
විජේගුනසිංහ, පියසීලි, (2005). නූතන සිංහල සාහිත්‍ය විචාරය, මාක්ස්වාදී අධ්‍යයනයක්. (දෙවන මුද්‍රණය) කොළඹ 10, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.
සිරිමාන්න, ඒ.එම්.පී. (2002).ඩී.එච්. ලෝරන්ස් සහ ගුණදාස අමරසේකර නවකතා. වීමංසා නවකතා අංකය. කොළඹ 10 ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
සිළුමිණ. පුන්කලස. (2006-04-02) iii පිට.

## References

Dissanayake, Wimal, (2005). Enabiling Traditions: Four Sinhala Cultural Intelelctuals. Boralesgamuwa, Visidunu Publications.
Obeysekara, Ranjini, (1974) Sinhala Writing and the New Critics. Colombo, M. D. Gunasena.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -28